# ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව
## අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය

DNCWS

**<u>ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘති නැවත සජීවී කිරීම</u>**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 677 කිරිදිවත්ත ග්‍රාම නිලධාරී වසමේ ශ්‍රී බෝධි ප්‍රජා මූල සංවිධානයේ මිලියන තුනකට අසන්න මුදලක් වියදම් කරමින් 2012 වර්ෂයේ ජල ව්‍යාපෘතියක් ආරම්භ විය. ප්‍රතිලාභී නිවාස 197කට අවශ්‍ය ජල පහසුකම් සහ සනිපාරක්ෂක කටයුතු වැඩිදියුණු කිරීම මූලික අභිප්‍රාය වී තිබුණි. ජල ව්‍යාපෘතියේ අභිමතාර්ථ සඵල කරමින් ජල සම්බන්ධතා 178ක් 2012 වර්ෂය අවසාන වන විට ලබා දී තිබුණි.


නමුත් ප්‍රජා මූල සංවිධානය 2020 වන විට ක්‍රියාත්මක කරගෙන යා නොහැකි වන සේ අකර්මන්‍ය වී තිබුණි. ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතුපාදක වී තිබුනේ ප්‍රජා මූල සංවිධානයේ කළමනාකාරීත්ව දුර්වලතා, මූල්‍ය කලනමකරණ දුර්වලතා ව්‍යාපෘතිය තුල සිදු විය යුතු ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොවීම ජලයේ ගුණාත්මකභාවය පිරිහී ගොස් තිබීමය. එමෙන්ම දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවීම් කටයුතු සිදුකර නොතිබීමද මෙම ගැටලුව සඳහා හේතු වී තිබුණි.

2020 වර්ෂයේ මාර්තු මාසය වන විට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරීන් සම්බන්ධ වීම නිසා ක්ෂේත්‍ර සමීක්ෂණයේදී ප්‍රජා මූල සංවිධානයේ ගැටළු අවබෝධ විය. ඒ වන විට ගම්මානයේ පොළී මුදල් ලබා දෙන අයගෙන් රු. 59000.00 ක අත්මුදල් ගෙන විදුලි බිල ගෙවා තිබුණි. පසුව අනුරාධපුර දිස්ත්‍රික් ස්ථානභාර නිලධාරිගේ මගපෙන්වීමෙන් සංවර්ධන නිලධාරී විසින් ජල ව්‍යාපෘතිය ආවරණය වන කුඩා හල්මිල්ලෑව, කිරිදිවත්ත, සඳගල යන ගම්මාන ත්‍රිත්වයම ආවරණය වන පරිදි කුඩා කණ්ඩායම් රැස්වීම් පවත්වා ගැටළු සාකච්ඡා කර සමස්ත ව්‍යාපෘතියම නියෝජනය වන පරිදි දිස්ත්‍රික් ස්ථානභාර නිලධාරී සංවර්ධන නිලධාරී මැදිහත් වීමෙන් රැස්වීමක් පවත්වා සමස්ත ගැටළු අනාවරණය කර ගනිමින් ප්‍රජා මූල සංවිධානය ප්‍රතිසංවිධානය කිරීම සඳහා අවශ්‍ය සැලැස්ම සකස් කෙරිණි.

ප්‍රජා මූල සංවිධානයේ ප්‍රතිලාභී පවුල් පලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දෙපාර්තමේන්තුව සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් සංවිධාන විගණනය කරන බාහිර විගණන නිලධාරීන් සහසම්බන්ධ වෙමින් මහසභා රැස්වීමක් පවත්වා පැරණි නිලධාරීන් සතුව පැවති ගිණුම් ලේඛන දෙපාර්තමේන්තුව හරහා බාහිර විගණනය සඳහා ලබා දුනි. එමෙන්ම නව නිලධාරී මණ්ඩලයක් පත්කර කුඩා කණ්ඩායම් හරහා විධායක සභාව පත්කර ප්‍රජා මූල සංවිධානය ප්‍රතිසංවිධානය කෙරිණි. මේ වන විට වැටුප් රහිතව නඩත්තු භාරකරු ජල ව්‍යාපෘතියේ කටයුතු සිදු කරගෙන ගොස් තිබූ අතර ඔහු සහ නව නිලධාරී මණ්ඩලය දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලය වෙත කැඳවා අවශ්‍ය පුහුණු වීම් ලබා දුනි. දැන්වීමක් පලකොට ගිණුම් ලිපිකරු තනතුර සඳහාද අයෙකු පත්කර ගත අතර ඇයට අවශ්‍ය පුහුණුවීම් දිස්ත්‍රික් කාර්යාලය හරහා ලබා දුනි.

බාහිර විගණනය සඳහා සති දෙකක කාලයක් ගත වූ අතර එහිදී අක්‍රමිකතා හඳුනාගෙන හිටපු නිලධාරීන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කෙරිණි. ජල බිල හා සම්බන්ධ අයක්‍රමයන් දෙපාර්තමේන්තුවේ සහ ප්‍රජා මූල සංවිධානයේ පැරණි මනු කියවන්නා සම්බන්ධ කරමින් සකස් කරගන්නා ලදී. එහිදී හඳුනාගත් ප්‍රධානතම ගැටලුව වූයේ මීටර් වල පවතී අක්‍රිය ස්වභාවයයි. දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත දිස්ත්‍රික් කාර්යාලය හරහා මීටර් 25ක් ප්‍රජා මූල සංවිධානයට ලබා දී එය පළමුව නිවාස 25කට ලබා දී ඒ සඳහා මුදල් මාස තුනකින් අයකර නැවත මීටර් ප්‍රමාණයක් ලබා ගැනිණ. මේ ආකාරයට වර්ෂයක කාලයක් තුල සියලුම නිවාස වල මීටර් අලුත් කෙරිණ. ඒ අතර කාලයේ ජල මූලාශ්‍රය, ටැංකිය පිළිසකර කර ගැනීම ප්‍රජාවගේ දායකත්වයෙන් සිදුකරගෙන යන ලදී. දිස්ත්‍රික් කාර්යාලයේ සම්බන්ධීකරණය සහිතව මසකට වතාවක් විධායක සභා පවත්වා ගැටළු සාකච්ඡා කරන අතර මාස 4කට වරක් මහා සභාවක් පවත්වයි. වසරකට වරක් බාහිර විගණනයක් සිදු කරන අතර ජල සාම්පල් පරීක්ෂාවද වසරකට වරක් සිදු කරයි.

2024 වර්ෂය අවසානය වන විට කිරිදිවත්ත ශ්‍රී බෝධි ප්‍රජා මූල සංවිධානය සතුව ලක්ෂ 12කට අධික මුදලක් තැන්පතු වශයෙන් පවතී. මේ වන විට කිසිඳු ගැටලුවකින් තොරව සක්‍රීයව ප්‍රජා මූල සංවිධානය ජල ව්‍යාපෘතියේ කටයුතු සිදු කරගෙන යනු ලබයි. මෙම සියලු කාර්යයන් අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය හරහා මෙහෙයවීම හා අධීක්ෂණය කරනු ලබයි.



**පිටපත** : ස්ථාන භාර නිලධාරී (අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය)